# ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.
## ප්‍රධාන කාර්යාලය
## ඇබෑර්තුව

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම පිණිස, ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | ශ්‍රේණිය | වැටුප |
|---|---|---|
| භාෂා පරිවර්තක<br>(දෙමළ බස ඉංග්‍රීසි බසට) | ඒ-6 | රු.118970- 147595<br>5x1465:10x2130 |

**පත්වීමේ ස්වභාවය** - ස්ථිර පදනම (ඇබෑර්තු සංඛ්‍යාව 01)

**<u>තනතුරට අදාළ සුදුසුකම්</u>**

1. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ගෞරව උපාධියක් හෝ ඒ හා සමාන අන් සුදුසුකමක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු තුනක (03) පශ්චාත් උපාධි පළපුරුද්දක් තිබිය යුතුය.

   නැතහොත්,

2. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් සාමාන්‍ය උපාධියක් හෝ ඒ හා සමාන අන් සුදුසුකමක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු හතරක (04) පශ්චාත් උපාධි පළපුරුද්දක් තිබිය යුතුය.

   නැතහොත්,

3. පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් ජාතික තාක්ෂණ , විද්‍යා ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන අන් සුදුසුකමක් සමඟ අධීක්ෂණ මට්ටමේ අවුරුදු පහක් (05) ඇතුළුව අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු අටක (08) පශ්චාත් ඩිප්ලෝමා පළපුරුද්දක් තිබිය යුතුය.

**<u>වයස් සීමාව</u>**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට නොවැඩිවීම (රජයේ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**<u>කාර්ය ක්ෂේත්‍රය</u>**

සංස්ථාවේ පාලනාධිකාරිය විසින් දෙනු ලබන ලිපි ලේඛන හා සංස්ථාවේ සෑම කාර්යාංශයක් මගින් ඉදිරිපත් කරනු ලබන දෙමළ භාෂාවෙන් රචිත ලිපි ලේඛන ඉංග්‍රීසි බසින් පරිවර්තනය කිරීම සහ ඉංග්‍රීසි බසින් රචිත ලිපිලේඛන දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමේ පළපුරුද්දක් තිබිය යුතුය. ඊට අමතරව තමා අයත් ශ්‍රේණියට හෝ ඊට ඉහළ ශ්‍රේණියකට අදාළ වෙනත් රාජකාරි පවරනු ලැබූ විට ඒවා ඉටු කිරීම.

**<u>පොදු අවශ්‍යතා</u>**

- යහපත් චරිතයකින් හෙබි වීම.
- මෙම තනතුරේ කාර්යභාරය සහ වගකීම දැරීම සඳහා කායික සහ මානසික යෝග්‍යතාවයන් පැවතීම.
- දැන්වීමේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට හෝ ඊට පෙර අවශ්‍ය අවම සුදුසුකම් හා පළපුරුද්ද ලබා තිබීම.
- පරිගණක සාක්ෂරතාවය පිළිබඳ අවබෝධය

...02

<u>අමතර ප්‍රතිලාභ</u>

සංස්ථාවේ වෛද්‍යාධාර ක්‍රමය යටතේ නොමිලයේ වෛද්‍යාධාර පහසුකම්, නිවාස ණය පහසුකම් , වාහන ණය පහසුකම් යනාදිය හිමිවනු ඇත.

සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකත්වය සඳහා සේවකයා තම වැටුපෙන් 10% ක ප්‍රමාණයකින් දායක විය යුතු අතර, ඒ සඳහා සංස්ථාවෙන් 15% ක ප්‍රමාණයක් ගෙවනු ලැබේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙනුවෙන් වැටුපෙන් 3% ක ප්‍රමාණයක් සංස්ථාවෙන් ගෙවනු ලැබේ.

<u>වෙනත්</u>

සියලුම බඳවා ගැනීම් සඳහා සංස්ථාවේ කාර්ය සංවිධාන සංග්‍රහයේ හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ නියමයන් බලපැවැත්වේ.

<u>අයදුම්කිරීමේ පිළිවෙල.</u>

සංස්ථා වෙබ් අඩවියේ (www.ceypetco.gov.lk ) පළ කර ඇති පොදු අයදුම්පත්‍රයේ ආකෘතිය භාවිතා කර ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය සමඟ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව විස්තරාත්මක අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු වේ.

රජයේ දෙපාර්තමේන්තුවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු අතර, ඔවුන් විසින් අදාළ අයදුම්කරු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත්, තම ආයතනයෙන් මුදා හැරීමට ඇති හැකියාව සඳහන් කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර, 2018.05.08 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

ඉහත අවශ්‍යතාවන්ට නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැ.බ. කළමනාකාර අධ්‍යක්ෂ
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.
අංක.609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

2018.04.25 දින,
එස්/එස්